දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය - රුහුණ විශ්වවිද්‍යාලය
Distance and Continuing Education Unit – University of Ruhuna

ශාස්ත්‍රවේදී සාමාන්‍ය (බාහිර) උපාධි ප්‍රථම භාග 2014 ප්‍රථම වර පරීක්ෂණය - 2017 අප්‍රේල්
Bachelor of Arts General (External) Degree Part I Regular Examination 2014 - April 2016

ආවිසා 2.2 - සාර්ව ආර්ථික න්‍යාය
ECG 2.2 - Macroeconomic Theory

කාලය පැය තුන යි

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

---

01. i. 'ව්‍යාපාර චක්‍රයක්' යන්න නිර්වචනය කොට එහි විවිධ අවධීන් පැහැදිලි කරන්න. (ලකුණු 08)

ii. "ව්‍යාපාර චක්‍රයක හැරවුම් ලක්ෂ්‍යයන් තීරණය වන මූලිකතම සාධකය වන්නේ ආර්ථිකයේ මූල්‍ය ප්‍රවාහයෙහි සිදුවන වෙනස්කම්ය." (සර් රැල්ෆ් හැට්‍රි - Sir Ralph Hawtrey) සාකච්ඡා කරන්න. (ලකුණු 12)

02. i. වෙළෙඳපොළ මිල යටතේ දළ ජාතික නිෂ්පාදිතය" සහ "සාධක පිරිවැය යටතේ දළ ජාතික නිෂ්පාදිතය" යන සංකල්ප අතර වෙනස පැහැදිලි කරන්න. (ලකුණු 04)

ii. ඉහත සංකල්ප දෙක අතර පැවතිය හැකි වෙනස අවම කරවීම සඳහා රටක ආණ්ඩුවට ගත හැකි ක්‍රියා මාර්ග පැහැදිලි කරන්න. (ලකුණු 04)

iii. එක්තරා කල්පිත ආර්ථිකයක සාර්ව ආර්ථික දත්ත පෙළක් පහත දැක්වේ. ඒවා උපයෝගී කොට ගනිමින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. සියළු දත්ත රුපියල් මිලියන වලිනි.

| වැයකළ හැකි ආදායම | පෞද්ගලික ඉතුරුම් |
|---|---|
| 1000 | 150 |
| 2000 | 350 |
| 3000 | 550 |

පෞද්ගලික ආයෝජනය (I) = 120
රජයේ මිලදී ගැනීම් (G) = 100
රජයේ බදු ($T_x$) = 80
රජයේ සංක්‍රාම ($T_r$) = 55

(අ) මෙම ආර්ථිකයේ ඉතුරුම් ශ්‍රිතය හා පරිභෝජන ශ්‍රිතය ඇස්තමේන්තු කරන්න. (ලකුණු 04)

(ආ) සමතුලිත ජාතික ආදායම් මට්ටම ගණනය කරන්න. (ලකුණු 05)

(ඇ) මෙම ආර්ථිකයේ පූර්ණසේවා නියුක්ති සමතුලිත ආදායම් මට්ටම රුපියල් මිලියන 2000 ලෙස ඇස්තමේන්තු වූයේ යැයි සිතන්න. එම ජාතික ආදායම් ඉලක්කය ළඟා කර ගැනීම සඳහා පෞද්ගලික ආයෝජනය කොපමණ ප්‍රමාණයකින් ඉහළ නැංවිය යුතු දැයි ගණනය කරන්න.

(ලකුණු 03)

03. එහි අන්තර්ගත සංකල්ප පැහැදිලි කරමින් "මුදලට ඇති ඉල්ලුම තීරණය වීම පිළිබඳ ද්‍රවශීලතාවරණ න්‍යාය" පිළිබඳ රචනයක් ලියන්න.

(ලකුණු 20)

04. පහත සඳහන් ඕනෑම <u>දෙකක්</u> පිළිබඳව කෙටි සටහන් ලියන්න.

I. මුදල් සැපයුම පිළිබඳ මුදල් ගුණක න්‍යාය
II. ප්‍රාග්ධනයේ ආන්තික කාර්යක්ෂමතාව
III. සමස්ත ඉල්ලුම් වක්‍රයේ ව්‍යුත්පන්නය (Derivation)
IV. ත්වරණ මූලධර්මය

(එක් කොටසකට ලකුණු 10 බැගින් මුළු ලකුණු 20)

05. I. එක් එක් පියවරයන් පැහැදිලිව විස්තර කරමින් IS සහ LM වක්‍රයන්හි ව්‍යුත්පන්නය ප්‍රස්තාරිකව නිරූපණය කරන්න.

(ලකුණු 08)

II. ISLM වක්‍ර විග්‍රහය යොදා ගනිමින් පහත සඳහන් දෑ පැහැදිලි කරන්න.

(අ) රාජ්‍ය වියදම් වැඩිවීමක තෙරපුම් ප්‍රතිවිපාකය (Crowding out effect)

(ලකුණු 06)

(ආ) තෙරපුම් ප්‍රතිවිපාකයේ තරම තීරණය කරන සාධක

(ලකුණු 06)

06. පහත සඳහන් සමීකරණයන්ගෙන් එක්තරා කල්පිත ආර්ථිකයක ව්‍යුහය විස්තර වේ. (සියළු ස්වායත්ත වියදම් රුපියල් මිලියන වලිනි)

| | | |
|---|---|---|
| පෞද්ගලික පරිභෝජනය (C) | = | $100 + 0.8\,(Yd)$ |
| පෞද්ගලික ආයෝජනය (I) | = | $150 - 10\,i$ |
| රජයේ මිලදීගැනීම් (G) | = | 160 |
| රජයේ බදු ($T_x$) | = | $0.3\,Y$ |
| ශුද්ධ අපනයන ($X_n$) | = | $40 - 0.06\,Y$ |
| මුදල් සැපයුම ($M_s$) | = | 150 |
| මුදල් ඉල්ලුම ($M_d$) | = | $0.2\,Y - 2\,i$ |

I. මෙම ආර්ථිකය සඳහා වන IS සහ LM ශ්‍රිත සොයන්න.

(ලකුණු 06)

II. සාර්ව සමතුලිතයට අදාල ආදායම් මට්ටම ගණනය කරන්න.

(ලකුණු 04)

III. මෙරට මධ්‍යම බැංකුව ආර්ථිකයේ ද්‍රවශීලතාව ඉහළ නැංවීමේ අරමුණින් මුල්‍ය සමස්තය රුපියල් මිලියන 150 සිට 162 දක්වා ඉහළ නැන්වීමට ගත් ප්‍රතිපත්තිමය තීරණයක් හේතුවෙන්

(අ) LM වක්‍රය මත ඇතිකළ හැකි ප්‍රතිවිපාක සහ

(ලකුණු 05)

(ආ) ද්‍රවශීලතා සහ ආදායම් ප්‍රතිවිපාක ගණනය කරන්න.

(ලකුණු 05)

07. I. මුල්‍යවාදයේ එන උද්ධමනීය පරතරය (Inflationary Gap) නැමැති සංකල්පය පැහැදිලි කරන්න.

(ලකුණු 06)

II. පිරිවැයෙන් තල්ලු වූ (Cost – push) සහ ඉල්ලුමෙන් ඇදුණු (Demand-pull) උද්ධමනයන් විස්තර කොට එම එක් එක් උද්ධමනයක් පාලනය කිරීම සඳහා යෙදිය හැකි ආර්ථික උපාය මාර්ග සාකච්ඡා කරන්න.

(ලකුණු 14)

08. I. ජාත්‍යන්තර වෙළෙඳාමට හේතු විස්තර කරන - රිකාඩෝගේ සාපේක්ෂ වාසි න්‍යායයේ අවසාන නිගමනය ලියා දක්වන්න.

(ලකුණු 05)

II. පහත සපයා ඇති වගුවෙන් දක්වෙන්නේ ඇමරිකාව සහ එංගලන්තය යන දෙරටට තිරිඟු (W) සහ රෙදි (C) යන භාණ්ඩ දෙවර්ගයේ එක් ඒකකයක් බැගින් නිෂ්පාදනය කිරීම සඳහා වැය වන ශ්‍රම පැය ගණනයි.

| | ඇමරිකාව | එංගලන්තය |
|---|---|---|
| තිරිඟු (W) | 6 | 1 |
| රෙදි (C) | 4 | 2 |

එය නිවැරදි වීමට අවශ්‍ය තර්කයන් සහ උපකල්පන පැහැදිලිව දක්වමින් සහ ඉහත වගුවේ තොරතුරු උපයෝගී කොට ගනිමින් රිකාඩෝගේ සාපේක්ෂ වාසි න්‍යායයේ නිගමනය සාධනය කරන්න.

(ලකුණු 10)

III. රිකාඩියානු වෙළෙඳ න්‍යාය මත කරනු ලැබ ඇති ප්‍රත්‍යක්ෂමූලික පර්යේෂණයන්ගේ ප්‍රතිඵල පැහැදිලි කරන්න.

(ලකුණු 05)